කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2015

2020 - අගෝස්තු

**BCOME 1055 – ව්‍යාපාර හා කාර්මික නීතිය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ඔබ විසින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගෙන මුළු ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

1 කොටස

ප්‍රශ්ණ අංක 01

අ. වලංගු ගිවිසුමක් සෑදීම සඳහා අවශ්‍ය මූලිකාංග 05 ක් සුදුසු නිදසුන් ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

ආ. රෝෂිනි සිය නිවස අජිත් වෙත රු. මිලියන 15 කට විකිණීම සඳහා අර්පනයක් ඉදිරිපත් කරයි. නමුත් අජිත් එම නිවස රු. මිලියන 13 කට මිලදී ගැනීමට කැමැත්ත පළ කලත් රෝෂිනි එම මිලට නිවස විකිණීම ප්‍රතික්ෂේප කරයි. දිනකට පසු නැවතත් අජිත් එම නිවස රු. මිලයන 15 කටම මිලදී ගැනීමට කැමැත්ත පළ කලද රෝෂිනි එයද ප්‍රතික්ෂේප කරයි. දැන් අජිත් රෝෂිනිට එරෙහිව ගිවිසුම් කඩ කිරීම මත නඩු පැවරීමට අදහස් කරයි. විනිශ්චිත නඩු තීන්දු කෙරෙහි අවධානය යොමු කරමින් අදාල පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 02

අ. බන්දු සමන්ගෙන් වාහනයක් රු. මිලියන 2 කට මිලදී ගනියි. බන්දු සහ සමන් මෙහිදී උපරිම සද්භාවයෙන් කටයුතු කරන ලදී. මාස හයකට පසුව හෙළි වූයේ අදාල මෝටර් රථය සොරකම් කරන ලද එකක් බවයි. එබැවින් බන්දුට අදාල රථය එහි නිසි අයිතිකරුට භාර දීමට සිදු විය. බන්දු, එම රථයේ මිල ලබා ගැනීම සඳහා සමන්ට එරෙහිව නඩු පැවරුවේය. බන්දුට අදාල මුදල ලබා ගැනීමට හැකි දැයි උපදෙස් දෙන්න.

(ලකුණු 10)

ආ. භාණ්ඩයක අයිතිය විකුණුම්කරුගෙන්, ගැනුම්කරු වෙත මාරු වීමට අදාල භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ සඳහන් රීති 05 සැකෙවින් දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 03

අ. වලංගු අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය ස්ථාපිත කිරීමට සපුරාලියයුතු කොන්දේසි මොනවාදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. නියෝජිතයෙකු සතු යුතුකම් 05 ක් සුදුසු නිදසුන් ඇසුරින් දක්වන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. හවුල් ව්‍යාපාරයක වාසි සහ අවාසි මොනවාද ?

(ලකුණු 08)

ආ. A සහ සමාගම සහ B සහ සමාගම එක්තරා ව්‍යාපාරයක නියුක්ත වී සිටි තරගකාරි ආයතන දෙකකි. A සහ සමාගමේ, හවුල්කරුවෙකු වූ ඇන්ඩෘ B සහ සමාගමේ ලිපිකරුවෙකු වූ බර්ටි වෙත අල්ලසක් ලබා දී එම ආයතනයේ භාණ්ඩ වල මිල සහ ගණුදෙනුකරුවන් පිළිබඳව වූ රහස් තොරතුරු ලබා ගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස B සහ සමාගම පාඩු ලැබීය. තමාට සිදු වූ පාඩුව අය කර ගැනීම සඳහා B සහ සමාගම A සහ සමාගමට එරෙහිව නඩු පැවරිය. B සහ සමාගමට මෙ සම්බන්ධයෙන් උපදෙස් දෙන්න.

(ලකුණු 06)

ඇ. "ගණුදෙනු කළ නොහැක " සහ "ආදායකයාගේ ගිණුමට පමණයි" යනුවෙන් රේඛණය කිරීම් අතර ඇති වෙනස දක්වන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

11 කොටස

ප්‍රශ්ණ අංක 05

අ. බෙස්ට් බයි සමාගම වත්තල සිය වෙළඳසැලක් පවත්වාගෙන යයි. එහි සේවකයන් 100 ක් පමණ සේවයේ යෙදේ. ඊට අමතර තවත් දස දෙනෙකු පිරිසිදු කරන්නන් වශයෙන් එහි සේවය කරන අතර ඒ අයගේ රැකියාවේ ස්වභාවය පැහැදිලි නැත. මෙම සේවකයන් පසුගිය තෙවසර පුරාවට මෙම ආයතනයෙහි සේවය කරන අතර ඔවුන්ව ආයතනය වෙත යොමු කරන ලද්දේ ABC මෑන් පවර් ආයතනයයි. ඔබ අදාල ආයතනයේ වෘත්තිය සමිතියෙහි නීති උපදේශක වශයෙන් කටයුතු

කරන බැව් උපකල්පනය කරන්න. මෙම සේවකයන් දස දෙනා අදාල ආයතනයේ සේවකයන්ද, නැතිනම් ස්වාධීන ගිවිසුම් කරුවන්දැයි යන්න දක්වන්න.

ඒ සඳහා වඩාත් ඵලදායි වූ උපදෙස් ලබා දීම උදෙසා අවශ්‍ය කරන අමතර තොරතුරු මොනවාද ?

(ලකුණු 10)

ආ. "පරිවාස කාල සීමාව තුළ සේවකයෙකු සේවයෙන් නෙරපා හැරීමට සේවා යෝජකයාට අයිතිය තිබේ." ශ්‍රී ලංකාවේ බලපවත්නා කම්කරු නීතියට අනුව "පරිවාස සේවකයන්ගේ" ස්වභාවය පිළිබඳව දක්වන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 06

පහත සඳහන් දෑ කෙරෙහි අවධානය යොමු කරමින් 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත පිළිබඳව සටහනක් ලියන්න.

අ. වැඩ කරන කාලය
ආ. පොදු නිවාඩු
ඇ. වාර්ෂික නිවාඩු
ඉ. අනියම් නිවාඩු
ඊ. පත්වීමේ ලිපිය
උ. මාතෘ ප්‍රතිලාභ

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 07

අ. කාර්මික ආරවුල් නිරවුල් කිරීම පිළිබඳව කාර්මික ආරවුල් පනතේ සඳහන් විවිධ වූ ක්‍රම කවරේද ?

(ලකුණු 06)

ආ. සේවායෝජකයෙකු යනු කවරෙක් ද ? විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. "සමථකරණය" මගින් කාර්මික ආරවුලක් විසඳීම පිළිබඳව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 08

අ. පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික උදෙසා හිමිකම් නොමැති අය කවරෙක්ද ?

(ලකුණු 04)

ආ. පාරිතෝෂිත මුදල ගණනය කිරිම උදෙසා පාරිතෝෂිත ගෙවීම් පනතේ දක්වා ඇති විවිධ ක්‍රම කවරේද?

(ලකුණු 06)

ඇ. අර්ථසාධක අරමුදලේ අන්තර්ගත මුදල් ලබා ගැනීමට සේවකයන්ට හැකි වන්නාවූ හේතු 05 ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 05)

ඉ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල අතර ඇති අසමානකම් 05 ක් දක්වන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)